රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 23 /2013

මගේ අංකය : EST/8/ALLOW/03/0151
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2013.11.12

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**2012 අයවැය යෝජනාවට අනුව ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට අයත් නිලධරයන් සඳහා ගෙවනු ලබන ක්ෂේත්‍ර කටයුතු දීමනාව රාජ්‍ය සේවයේ නියුතු වාස්තු විද්‍යාඥ සේවයේ නිලධරයන්ට ලබා දීම**

2012 අයවැය යෝජනා අනුව ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට අයත් නිලධරයන් සඳහා මාසිකව රු.15000/-ක දීමනාවක් ගෙවීම සඳහා නිකුත් කරන ලද 2011.12.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 28/2011 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. 2013.04.01 දින සිට ඉහත චක්‍රලේඛයෙහි විධිවිධාන ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ නිලධරයන් සම්බන්ධයෙන් ද අදාල කර ගැනීමට 2013 ජුලි මස 25 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

03. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිව නිකුත් කෙරේ.



පී.බී. අබේකෝන්
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය